රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2023

ගරු රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ පණිවිඩය.....



වසර 2048 දී සංවර්ධිත ශ්‍රී ලංකාවක් සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වැවිලි ක්ෂේත්‍රයේ අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා 2023 ඔක්තෝබර් මස දී අභිනවයෙන් පිහිටුවන ලද රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ ප්‍රථම වාර්ෂික කාර්ය සාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සම්බන්ධව සතුටු වෙමි.

රාජ්‍ය වැවිලි ව්‍යවසායන් හා ප්‍රාදේශීය වැවිලි සමාගම් සතු භාවිතයට නොගත් හා ඌන උපයෝජිත ඉඩම් හඳුනා ගැනීම, එම ඉඩම් සිතියම්ගතකරණයට කටයුතු කිරීම, සංවර්ධන විභවතා හඳුනා ගැනීම හා ඒ වෙනුවෙන් සැලසුම් සකස් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය මෙන්ම රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනයන්හි කලක් පුරා නොවිසඳී පැවති සේවකයන් සඳහා වූ සියළු හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම සඳහා පියවර ගැනීම ඇතුළු කර්යයන් රැසක් ඉටු කරමින් අමාත්‍යාංශයේ ඉදිරි ගමන සඳහා පසුගිය වසර තුළදී සාර්ථක අඩිතාලමක් ගොඩනගන්නට හැකි වීම පිළිබඳව සතුටට පත්වෙමි.

අමාත්‍යාංශයේ කර්යයන් හා කර්තව්‍යයන් මේ වසරේ ද සාර්ථකව ඉදිරියට ගෙන යමින් වැවිලි ක්ෂේත්‍රයේ නියුතු රාජ්‍ය ව්‍යවසායන්හි අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීමටත්, ඉඩම් හා සම්පත් භාවිතය උපරිමව ප්‍රශස්ත කිරීමටත්, එම ව්‍යවසායන් පූර්ණ ඵලදායිව ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන් ආයෝජනය කරලීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්තුමා, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු සියලුම නිලධාරීන්ටත්, අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනයන්හි සභාපතිවරුන් ඇතුළු සියලුම නිලධාරීන්ටත් අවස්ථාව හා හැකියාව ලැබේවායි සුභ ප්‍රාර්ථනා කරමි.

රංජිත් සියඹලාපිටිය (පා.ම.)
රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය.....



රාජ්‍ය වැවිලි ව්‍යවසායන්හි ප්‍රශස්ත ඵලදායීත්වය උදෙසා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, වාණිජ වැවිලි කළමනාකරණය සඳහා අවශ්‍ය වන විභවතා හඳුනා ගැනීම සහ අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම, කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන දෙඅංශයේම තිරසාරත්වය සහතික කරමින් එම අංශයන්හි නියැලෙන මානව සම්පත්හි ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම යන අරමුණු පෙරදැරිව 2023.10.23 දින අංක 2355/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

අභිනවයෙන් මෙම අමාත්‍යාංශය පිහිටුවීමේදී මුහුණ පෑමට සිදුවූ ගැටළු හා අභියෝග ජය ගනිමින් ගරු රංජිත් සියඹලාපිටිය අමාත්‍යතුමාගේ උපදෙස් හා මහ පෙන්වීම මත මහජන සේවා කාර්යක්ෂම ලෙස සපයමින් රාජ්‍ය වැවිලි ව්‍යවසායන් සතු ඉඩම් හා ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු පදනම මත ලබාදී ඇති ඉඩම් පූර්ණ සිතියම්ගතකරණයක් සඳහා කටයුතු කරමින් අමාත්‍යාංශයට පැවරුණු සුවිශේෂී කාර්යය රාමුව තුළ ප්‍රතිපත්තිමය වශයෙන් තීරණ ගැනීම සඳහා වූ සැලසුම් සකස් කිරීම හා අදාළ ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව කෙටි කාලයක් තුළ කටයුතු කිරීමට හැකිවීම පිළිබඳව සතුටු වෙමි.

නවීන තාක්ෂණය පෙරදැරිව අපනයනාභිමුඛ වාණිජ වැවිලි භෝග ක්ෂේත්‍රය හා අගය එකතු කළ කෘෂි නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා නිපුණතාවයෙන් හෙබි ශක්තිමත් දේශීය ව්‍යවසායකයන්ගේ ආයෝජන හඳුන්වා දීම, රාජ්‍ය ආදායම ඉහළ නැංවීම උදෙසා වැවිලි සමාගම් සතු ඌණ උපයෝජිත හා නිෂ්කාර්යය ඉඩම්හි භූමි ඵලදායීතාවය ඉහළ නැංවීම, වතු සමාගම් සතු බදු ගිවිසුම් සංශෝධනය, යාවත්කාලීන කිරීම හා අවශ්‍යතාවය අනුව නව ගිවිසුම් වලට එළඹීම, නව ප්‍රතිපත්ති සම්පාදනය, අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනයන් වෙත අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම හා ඊට අදාළ සැලසුම් සකස් කිරීම මෙන්ම රාජ්‍ය වැවිලි ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම 2024 වර්ෂයේ මෙම අමාත්‍යාංශය ඉලක්ක කර ගත් සුවිශේෂී වූ කාර්යයන් වශයෙන් සඳහන් කල හැකිය.

කෙටි කාල සීමාවක් තුළ අමාත්‍යාංශය අත්කර ගත් ඉහළ කාර්ය සාධනය සඳහා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම සමස්ත කාර්යය මණ්ඩලයේ දායකත්වය හා කැප වීමද, අමාත්‍යාංශයට අයත් අනුබද්ධිත ආයතන වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,ජනතා වතු සංවර්ධන මණ්ඩලය,සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම,සීමාසහිත හලාවත වැවිලි සමාගම, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම හා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම යන ආයතනයන්හි සභාපතිවරුන්, අධ්‍යක්ෂ මණ්ඩලය හා සමස්ත කාර්ය මණ්ඩලයෙන් ලබා දෙන දායකත්වය හා කැපවීම ද බෙහෙවින් අගය කොට සළකමි.

2024 වර්ෂයේ අප අමාත්‍යාංශයේ ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගනිමින් ඉහළ කාර්ය සාධනයක් ළඟා කර ගැනීමටත්, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට ඉහළ දායකත්වයක් ලබා දීමටත් අප සැමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි සුභාශිංසන පිරිනමමි.

ආචාර්ය එම්.එම්.එස්.එස්.බී යාලේගම
ලේකම්
රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය

පටුන

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය 1

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසායන් 7

01. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 8

02. ජනතා වතු සංවර්ධන මණ්ඩලය 11

03. සී/ස කුරුණෑගල වැවිලි සමාගම 14

04. සී/ස හලාවත වැවිලි සමාගම 20

05. සී/ස ඇල්කඩුව වැවිලි සමාගම 26

06. සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 30

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසායන් විසින් සිදුකරන අපනයනාභිමුඛ වැවිලි කර්මාන්තයන්හි පොදු ප්‍රගතිය 33

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය

ආයතනික පැතිකඩ

හැඳින්වීම

රාජ්‍ය වැවිලි ව්‍යවසායන්හි ඵලදායිතාවය සහ එම ආයතන විසින් උත්පාදනය කරනු ලබන ආදායම් ඉහළ නැංවීමත්, එම ආයතන පූර්ණ ලාභදායී ව්‍යවසායන් බවට පත් කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමත් මූලික අභිමතාර්ථයන් වන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය 2023.10.23 දින අංක 2355/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුකූලව පිහිටුවන ලදී. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත් වන වැවිලි ව්‍යවසායන් වනුයේ,

1. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
2. සීමාසහිත හලාවත වැවිලි සමාගම
3. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
4. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
5. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
6. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම

අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර

දැක්ම

ජාතික සංවර්ධනයට රාජ්‍ය වැවිලි ඉඩම්වලින් ලැබෙන දායකත්වය ප්‍රශස්ත කිරීම.

මෙහෙවර

රාජ්‍ය වැවිලි ඉඩම්වල ඵලදායිතාව ඉහළ නංවන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම, එම ඉඩම්වල තිබෙන කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම සහතික කිරීම සහ එම ක්ෂේත්‍රයේ සේවයේ යෙදී සිටින මානව සම්පත්හි සමාජ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම.

අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ විෂයයට සහ අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.


- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- රාජ්‍ය වැවිලි ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්ට අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම තුළින් ඒවායේ ඵලදායීතාවය සහ එම ආයතන විසින් උත්පාදනය කරනු ලබන ආදායම් ඉහළ නැංවීම.

- අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන් අධීක්ෂණය කිරීම.

අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය 2023.10.23 දිනැති හා අංක 2355/09 දරණ ගැසට් පත්‍රය මඟින් ස්ථාපිත කරන ලද අතර මෙම නව අමාත්‍යාංශය සඳහා සියළුම මානව හා අනෙකුත් සම්පත් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලෙසට අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව මෙම නව අමාත්‍යාංශය සෙත්සිරිපාය II අදියරයට අයත් ගොඩනැගිල්ලේ කඩිනමින් ස්ථාපිත කර කාර්ය මණ්ඩලය අනුයුක්තව, ස්ථිරව හා වැඩ බැලීමේ පදනම මත අනුයුක්ත කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම අභියෝග ජය ගැනීමක් ලෙස හඳුන්වා දිය හැක. එසේම මෙම අමාත්‍යාංශයට පැවරුන කාර්යභාර වපසරිය තුළ අදාළ රාජකාරී සැලසුම් සකස් කිරීම, ඊට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා හැකි උපරිම මට්ටමින් අදාළ ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව කටයුතු ඉටු කිරීම සිදු කරන ලදී.

2023 වසරට අදාළ කාර්ය සාධනය

මෙම අමාත්‍යාංශයට පවරන ලද කාර්යය හා කර්තව්‍යයන් ඉටු කර ගැනීම වෙනුවෙන් අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා 2023 වසර තුළදී පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- රාජ්‍ය වැවිලි ව්‍යවසායන් සමීප ලෙස අධික්ෂණය හා මෙහෙයවීමට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම.
- අමාත්‍යාංශය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය නිශ්චය කිරීම හා ඒ අනුව සංවිධාන ව්‍යුහය අනුමත කර ගැනීම.
- අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කළ හැකි වන පරිදි අත්‍යවශ්‍ය සේවක සංඛ්‍යාවක් අනුයුක්ත කර ගැනීම.
- රාජ්‍ය වැවිලි ව්‍යවසායන් සියල්ල පූර්ණ ප්‍රගති සමාලෝචනයකට ලක් කර ගත හැකි වීම හා එමගින් මේ වන විට ලාභදායීව ක්‍රියාත්මක වන හා පසුබෑමට ලක්ව ඇති රාජ්‍ය ව්‍යවසායන් හා අත්‍යවශ්‍ය වන ප්‍රතිසංස්කරණයන් හඳුනා ගැනීම.
- ප්‍රාදේශීය වැවිලි සමාගම් සමාලෝචනයකට ලක් කර මේ වන විට මුහුණ පා ඇති ගැටළු හා අභියෝග නිශ්චය කර ගැනීම හා ඒ සඳහා පිළියම් යෙදීමට මූලික පියවර ගැනීම.
- අදාල පාර්ශවයන්ගේ සහභාගිත්වය හා උපදේශකත්වය තුළින් වාණිජ වැවිලි කළමණාකරණය සඳහා වන අවශ්‍යතා හා විභවතා හඳුනා ගැනීම.
- රාජ්‍ය වැවිලි ව්‍යවසායන් හා ප්‍රාදේශීය වැවිලි සමාගම් සතු උපයෝජිත, ඌන උපයෝජිත සහ භාවිතයට නොගත් ඉඩම් දත්ත ඇතුලත් භූමි පරිහෝජන දත්ත පද්ධතියක් සකස් කිරීම.
- අමාත්‍යාංශය, රාජ්‍ය වැවිලි ව්‍යවසායන් හා ප්‍රාදේශීය වැවිලි සමාගම් හි භෞතික, මූල්‍ය, මානව සහ තාක්ෂණ සම්පත්, ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ජනතාවට සන්නිවේදනය කරවීම සඳහා නව වෙබ් අඩවියක් සකස් කිරීමට කටයුතු කිරීම.
- රාජ්‍ය වැවිලි ව්‍යවසායන් සන්තක ඉඩම් සහ ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට බදු පදනම මත ලබා දී ඇති ඉඩම් පූර්ණ සිතියම්ගතකරණයක් සඳහා කටයුතු සම්පාදනය කිරීම.

මූල්‍ය කාර්ය සාධනය

2023 වර්ෂයේ අගභාගයේදී මෙම අමාත්‍යාංශය පිහිටුවීම නිසා වැය ශීර්ෂයක් හෝ මූල්‍ය ප්‍රතිපාදන වෙන් වීමක් සිදු නොවූ අතර, මෙම අමාත්‍යාංශය සඳහා වැය වන වියදම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2023.10.23 දින 2355/10 දරණ ගැසට් නිවේදනය අනුව අහෝසි කරන ලද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන්වූ ප්‍රතිපාදන මඟින් කළමනාකරණය කර ගන්නා ලදී.

ගැටළු හා අභියෝග

අභිනවයෙන් අමාත්‍යාංශය පිහිටු වීමේදී කාර්යය මණ්ඩලය අනුයුක්ත කර ගැනීම හා අවශ්‍ය වාහන සහ අනෙකුත් භෞතික සම්පත් කඩිනමින් ලබා ගැනීම, ස්ථානයක් සකසා ගැනීම, වෙබ් අඩවියක් නිර්මාණය කිරීම යනාදි අනෙකුත් අවශ්‍යතා කෙටි කාලයක් තුළ ස්ථාපිත කිරීම, අමාත්‍යාංශ කාර්යභාරය තුල කාර්ය මණ්ඩලය යෙදවීම වැනි විවිධ අභියෝගයන් පැවතුනි.

2024 වර්ෂය සඳහා ඉදිරි ඉලක්ක

මෙම අමාත්‍යාංශය පිහිටුවීමේ මූලික පරමාර්ථයක් වන නවීන තාක්ෂණය උපයෝගි කරගත් අපනයනාභිමුඛ වාණිජ වැවිලි භෝග වගාව ප්‍රවර්ධනය කිරීම, අගය එකතු කළ කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධනය හා අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා ඌන උපයෝජිත සහ නිෂ්කාර්යයව වැවිලි සමාගම් භාරයේ පවත්නා විශාල පරිමාණයේ ඉඩම් දේශීය ව්‍යවසායකයන් වෙත බදු පදනමින් ලබා දී භූමි උපයෝගිතාව ඉහළ නැංවීම යන ඉලක්ක ළඟා කර ගැනීමට අපේක්ෂිතය.

- සුදුසු දේශීය ව්‍යවසායකයන් අපනයනාභිමුඛ වාණිජ වැවිලි කර්මාන්තයන්හි ආයෝජනය කරවීමට කටයුතු යෙදීම තුළින් අදාළ වැවිලි සමාගම් භාරයේ පවතින ඌන උපයෝජිත ඉඩම්වල උපයෝගිතාවය ප්‍රශස්ථ කරලීමට අපනයනාභිමුඛ වාණිජ වැවිලි භෝග නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් වැවීම, අගය එකතු කිරීම හා අපනයනය කිරීම සඳහා දේශීය ව්‍යවසායකයන් මඟින් කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම යන ආයතනයන්හි තිරසර බව හා ලාභදායිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යවසාය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට තවදුරටත් අවශ්‍ය වන ප්‍රතිපත්ති සකස් කිරීම හා අදාළ ආයතන මෙහෙයවීම.

- අපනයන ආදායම් උත්පාදනය හා ප්‍රවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රශස්ථ වාණිජ වැවිලි ඉඩම් කළමණාකරණයක් සඳහා නව ආයතනයක් පිහිටුවීම වෙනුවෙන් වන ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම, ක්‍රියාත්මක කිරීම හෝ මාර්ගෝපදේශ සැපයීම, පසු විපරම් හා අධීක්ෂණය කිරීම.

- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට අයත් වතු වල පිටත මායිම් ලකුණු කිරීම හා පූර්ණ සිතියම්ගතකරණය කිරීමට යොමු කිරීම මඟින් එම ආයතන සතු ඉඩම් ප්‍රමාණ නිශ්චය නිශ්චය කර ගැනීම, ඒවායේ පවත්නා ඌන උපයෝජිත හා නිෂ්කාර්යයව පවත්නා ඉඩම් හඳුනා ගැනීම හා එම ඉඩම් වෙන් කර මිනුම්ගත කර ගැනීමට කටයුතු කිරීම.

- වැවිලි ඉඩම් බදු දීම හා කොන්ත්‍රාත්තු කළමනාකරණය සඳහා සමෝධානිත යාන්ත්‍රණයක් සකස් කිරීම, එහිදී ඉඩම් බදු දී අදාළ ආයතන වෙත උපරිම බදු මුදලක් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට වඩා තිරසාර ලෙස

වාණිජ භෝග නවීන තාක්ෂණය උපයෝගී කරගෙන වගාව හා අගය එකතු කිරීම තුළින් අපනයනට යොමු කිරීම සහ එමඟින් කුසලතාවය හා නිපුණතාවය සහිත ශක්තිමත් දේශීය ව්‍යවසායකයන් බිහි කිරීම.

- රාජ්‍ය වැවිලි ව්‍යවසායන්හි පරිපාලනය ක්‍රමවත් කිරීම, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයීම.

- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ ප්‍රාදේශීය වැවිලි සමාගම් ඇති කර ගත් බදු ගිවිසුම් නිවැරදිව ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.

- අමාත්‍යාංශයේ වියදම් උපරිමව කළමනාකරණය කරමින් එහි වගකීම් හා කර්තව්‍යයන් ප්‍රශස්තව ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා අමාත්‍යාංශයේ ආයතනික ධාරිතාවය හා මානව සම්පත ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.

- ප්‍රාදේශීය වතු සමාගම් සමඟ පවතින බදු ගිවිසුම් සංශෝධනය කිරීම, යාවත්කාලීන කිරීම හෝ සුදුසු පරිදි නව ගිවිසුම් ඇති කරලීමට නව ප්‍රතිපත්ති සැකසීම.

- අමාත්‍යාංශයේ කටයුතු නව තාක්ෂණය සමඟ මුසු කරමින් හා පරිගණක ජාලගත කරමින් අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කරමින් මහජනතාව හා අදාළ පාර්ශවයන් වෙත තොරතුරු සන්නිවේදනය ඇතුළු සියළු සේවා සැපයීම් වඩා කාර්යක්ෂම කිරීම.

- රාජ්‍ය වැවිලි ව්‍යවසායන්හි ශක්‍යතා මත හඳුනා ගත් අපනයනාභිමුඛ වාණිජ වැවිලි වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම/ මාර්ගෝපදේශ සැපයීම.

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසායන්

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
2. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
3. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
4. සීමාසහිත හලාවත වැවිලි සමාගම
5. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
6. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

Sri Lanka State Plantations Corporation

JANATHA ESTATES DEVELOPMENT BOARD

Kurunegala Plantations Ltd.

Chilaw Plantations Limited

Elkaduwa Plantations Ltd.

Kalubowitiyana
The best CTC tea

01. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

හැඳින්වීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 දී අංක 4 දරණ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද අතර පසුව 1962 අංක 12 සහ 1979 අංක 49 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී. හෙක්ටයාර 10,989.86 පුරා පැතිරුණු වතු 16කින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සමන්විතය.

දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම

මෙහෙවර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගිත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වයක් ලබා දීම

2023 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය

විස්තරය	2023 ඉලක්කය	2023 ප්‍රගතිය
තේ ආදයම් වපසරිය (හෙක්)	3881.15	3881.15
රබර් ආදයම් වපසරිය (හෙක්)	29.72	29.72
සාදන ලද තේ කිලෝග්‍රෑම් 01 නිෂ්පාදන පිරිවැය	763.41	870.16
සාදන ලද තේ කිලෝග්‍රෑම් 01 ශුද්ධ විකුණුම් සාමන්‍යය	800.98	888.89
රබර් කිලෝග්‍රෑම් 01 නිෂ්පාදන පිරිවැය	714.50	1009.39
රබර් කිලෝග්‍රෑම් 01 ශුද්ධ විකුණුම් සාමන්‍යය	450.00	455.23
සමස්ථ වියදම (රු.මි.)	308.611	124.103
සමස්ථ ආදායම (රු.මි.)	104.401	114.835
ලාභය (රු.මි.)		- 92.673

(මූලාශ්‍රය - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව)

2023 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම් ප්‍රගතිය

- 2022 වර්ෂයේ ආරම්භ කල තේ නැවත වගා වැඩසටහනේ හෙක්ටයාර 160.93 න්, හෙක්ටයාර 157.61 අවසන් කර ඇත .
  *එහි ඉතිරිව ඇති හෙක්ටයාර 3.32 ප්‍රමාණය 2024 වසරේ මුල් කාර්තුවේ අවසන් කිරීමට නියමිතය.
- වලහන්දුව රාජ්‍ය වතුයායේ රු.මී.8.13ක් වැය කරමින් හෙක්ටයාර 2.2ක තේ වගාකිරීම සිදු කර ඇත.
- වලහන්දුව රාජ්‍ය වතුයායේ රු මී 11.53ක් වැය කරමින් හෙක්ටයාර 10ක පොල් වගාකිරීම සිදු කර ඇත.
- වලහන්දුව රාජ්‍ය වතුයායේ රු.මී.1.95ක් වැය කරමින් හෙක්ටයාර 08 කුරුඳු වගාකිරීම සිදු කර ඇත.
- අගය දාමය වැඩි කිරීමේ අරමුණින් 2022 වර්ෂයේ නව තාක්ෂණයට අනුව නවීකරණය කල ගෝමර කර්මාන්ත ශාලාව 2023 වර්ෂයේ මාර්තු මස 28 වන වැඩ ආරම්භ කරන ලදි.

2024 වර්ෂයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම්

- 2022 වර්ෂය තේ නැවත වගාව / නව වගාව වැඩසටහන තව දුරටත් ක්‍රියාත්මක කිරීම
- 2023 වර්ෂය තේ නැවත වගාව - පළමු අවුරුදු නඩත්තුව - හෙක්ටයාර 36.16
- 2022 වගා වර්ෂය - දෙවන අවුරුදු නඩත්තුව - හෙක්ටයාර 57.15
- 2022 වර්ෂය තේ නව වගාව - දෙවන වසර නඩත්තුව - හෙක්ටයාර 30.12
- 2023 වර්ෂය තේ නව වගාව - පළමු වසර නඩත්තුව - හෙක්ටයාර 34.50
- 2024 වර්ෂය තේ නව වගාව - හෙක්ටයාර 69.76
- 2024 වර්ෂය තේ පාළු පැල සිටුවීම - හෙක්ටයාර 75.38
- 2024 වර්ෂය තේ තවාන් පැල 3,000,000
- ඌන උපයෝජිත ඉඩම් දේශීය ව්‍යවසායකයන් මඟින් සංවර්ධනය කිරීම.

වලහන්දුව වතුයාය - ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම්

- තේ නව වගාව පළමු වසර නඩත්තුව - හෙක්ටයාර 2.00
- පොල් වගාව පළමු වසර නඩත්තුව - හෙක්ටයාර 10.00
- කුරුඳු වගාව පළමු වසර නඩත්තුව - හෙක්ටයාර 1.00
- 2024 වර්ෂය රබර් නව වගාව - හෙක්ටයාර 10.00
- 2024 වර්ෂය තේ නැවත වගාව - හෙක්ටයාර 8.00
- 2024 වර්ෂය කුරුඳු නව වගාව - හෙක්ටයාර 9.00

02.ජනතා වතු සංවර්ධන මණ්ඩලය

හැඳින්වීම

ලංකාවේ ප්‍රථම වාණිජ තේ වගාව 1867 දී ජේම්ස් ටේලර් විසින් රටේ දිගම තේ කම්හල පිහිටා ඇති ලූල්කොන්දෙරා වතුයායේ ස්ථාපිත කිරීමෙන් වසර 109කට පසු එයද ඇතුළුව හෙක්ටයාර 140,000ක් ආවරණය වන පරිදි වතු 263ක් කළමනාකරණය කිරීම සඳහා 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ 1976 දී ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) පිහිටුවන ලදී.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල හෙක්ටයාර් 20,000ක පමණ භූමි ප්‍රමාණයක් සතු මෙම ආයතනය විසින් කළමනාකරණය කරන තේ වතු 16ක් සහ රබර් වතු 02ක් ඇතුළුව වතු 18ක් පවතී. කොළඹ නගරයේ ප්‍රධාන ආර්ථික කේන්ද්‍රස්ථානයක් වන වොක්ෂෝල් වීදියේ ඉඩම් අක්කර 05ක ප්‍රධාන කාර්යාලය සහ කොළඹ ඩාර්ලි පාරේ තවත් හෙක්ටයාර 03ක බදු පදනම මත ලබා දී ඇති ඉඩමක් ද පවතින ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතුව ඉඩම්, වැවිලි භෝග, තේ කර්මාන්ත ශාලා, කුඩා විදුලි බලාගාර සහ අනෙකුත් ආර්ථික වශයෙන් ශක්‍ය දේපල හිමිය.

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ පිහිටි සුප්‍රසිද්ධ ලූල්කොන්දර සහ හන්තානේ වතුයාය කළමනාකරණය කිරීම ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු අභිමානයක් වක අතර ‘ජනවසම ජන තේ’ නිෂ්පාදනයෙන් ඉහළ කීර්තිනාමයක්ද ලබා ඇත. හන්තානේ වතුයාය තුළ ප්‍රසිද්ධ තේ කෞතුගාරයක්ද ස්ථාපනය කර ඇත.

දැක්ම

ප්‍රාදේශීය මට්ටමින් හොඳම මැදරට පාරම්පරික තේ නිෂ්පාදකයා වීම මගින් ඉහළම ශුද්ධ අලෙවි මිලක් ලබා ගැනීමෙන් ලාභ ලබන හා ශක්තිමත් රාජ්‍ය ආයතන අතරින් එකක් බවට පත්වීම.

මෙහෙවර

උපරිම කැපවීමකින්, පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පුද්ගල නිපුනතාවයන් සංවර්ධනයට වැඩි සැලකිල්ලක් දක්වමින් කණ්ඩායම් ක්‍රියාකාරිත්වය හරහා අරමුණු කරා ලඟා වීම තුළින් කර්මාන්ත අභිවෘද්ධියේ ප්‍රතිලාභ සමස්ථ රටටම හිමි කර දීම.

2023 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය

විස්තරය	2023 ඇස්තමේන්තුගත	2023 ප්‍රගතිය
නිෂ්පාදනය		
තේ නිෂ්පාදනය (දළු) - සමස්ත (කි.ග්‍රෑ.)	7,693,810.00	4,537,562.70
තේ නිෂ්පාදනය (නිමි තේ) - සමස්ත (කි.ග්‍රෑ.)	1,647,822.00	992,827.00
තේ හෙක්ටයාරයට අස්වැන්න -YPH (කි.ග්‍රෑ./හෙ.)	590.67	349.45
දළු විකුණුම් සාමාන්‍ය - NSA (රු./කි.ග්‍රෑ.)	833.35	518.76
ඒකක නිෂ්පාදන වියදම - COP (රු./කි.ග්‍රෑ.)	1,096.09	648.05
රබර් නිෂ්පාදනය (කි.ග්‍රෑ.)	388,842.00	296,768.00
රබර් හෙක්ටයාරයට අස්වැන්න -YPH(කි.ග්‍රෑ./හෙ.)	733.42	559.75
දළු විකුණුම් සාමාන්‍ය - NSA (රු./කි.ග්‍රෑ.)	450.20	461.49
ඒකක නිෂ්පාදන වියදම - COP (රු./කි.ග්‍රෑ.)	428.48	438.93
ආදායම (රු.මිලි.)		
වතු **ආදායම** - තේ	1,373.21	758.11
- රබර්	175.05	138.93
තේ අළෙවිකරණ **ආදායම**	985.05	417.51
ප්‍රධාන කාර්යාල **ආදායම**	145.87	127.86
අමතර **ආදායම**	385.44	95.91
සමස්ත ආදායම	**3,064.63**	**1,538.33**
වියදම (රු.මිලි.)		
වතු **වියදම** - තේ	1,806.16	947.05
-රබර්	166.61	132.14
තේ අළෙවිකරණ **වියදම**	877.99	300.98
ප්‍රධාන කාර්යාල **වියදම**	273.93	210.41
අමතර **වියදම**	-	-
සමස්ත වියදම	**3,124.69**	**1,590.59**
ලාභදායිත්වය (රු.මිලි.)		
තේ වතුවල **ලාභය**	-432.95	-188.94
රබර් වතුවල **ලාභය**	8.44	6.79
වතුවල වෙනත් විවිධ ආදායම්	385.44	95.91
වතුවල මුළු මෙහෙයුම් ලාභය	**-39.05**	**-86.23**
තේ අළෙවිකරණ **ලාභය**	107.05	116.53
ප්‍රධාන කාර්යාල **ලාභය**	-128.06	-82,55
සමස්ත ලාභය	**-60.06**	**-52.25**

(මූලාශ්‍රය - ජනතා වතු සංවර්ධන මණ්ඩලය)

2023 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම් ප්‍රගතිය

- තේ නැවත වගා කිරීම සම්බන්ධයෙන් වාර්ෂික ඇස්තමේන්තුගත මුදල වන රු.මි.72.82න් 9.5%ක් මේ වන විට අවසන් කර ඇති අතර, ඒ සඳහා රු.මි.6.96ක පමණ මුදලක් වැය කර ඇත.

- රබර් නැවත වගා කිරීම සම්බන්ධයෙන් වාර්ෂික ඇස්තමේන්තුගත මුදල වන රු.මි.56.60න් 31%ක් මේ වන විට අවසන් කර ඇති අතර, ඒ සඳහා රු.මි.17.72ක පමණ මුදලක් වැය කර ඇත.

- තේ තවාන්කරණය සම්බන්ධයෙන් වාර්ෂික ඇස්තමේන්තුගත මුදල වන රු.මි.27.86න් 29%ක් මේ වන විට අවසන් කර ඇති අතර, ඒ සඳහා රු.මි.8.05ක පමණ මුදලක් වැය කර ඇත.

- සමස්තයක් ලෙස නිමි තේ මෙ.ටො. 992.82 ද, රබර් මෙ.ටො. 296.76 ද නිෂ්පාදනය කරන ලදී.

- යුකැලිප්ටස් දැව ශාක පැළ 686 අලෙවියෙන් රු.මි. 53ක් ඉපයූ අතර, දැව ශාක පැළ 1600 නැවත වගා කර ඇත.

2024 වර්ෂයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම්

- වර්ෂය තුළ රු.මි.54.08ක අයවැය ගත පිරිවැයක් යටතේ නැවත තේ වගා කිරීම.

- වර්ෂය තුළ රු.මි.9.88ක අයවැය ගත පිරිවැයක් යටතේ නැවත රබර් වගා කිරීම.

- වර්ෂය තුළ රු.මි.21.50ක අයවැය ගත පිරිවැයක් යටතේ තේ තවාන්කරණය සිදු කිරීම.

- යුකැලිප්ටස් දැව ශාක පැළ 52,800 නැවත වගා කිරීම හා යුකැලිප්ටස් දැව ශාක 4,000 අලෙවියෙන් රු.මි. 240ක ආදායමක් ලැබීම.

- ඌන උපයෝජිත ඉඩම් දේශීය ව්‍යවසායකයන් මඟින් සංවර්ධනය කිරීම.

- සමස්තයක් ලෙස නිමි තේ මෙ.ටො. 1764 ද, රබර් මෙ.ටො. 407 ද නිෂ්පාදන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම.

03. සී/ස කුරුණෑගල වැවිලි සමාගම

හැඳින්වීම

1992 වර්ෂයේ දී ආරම්භ කරන ලද සී/ස කුරුණෑගල වැවිලි සමාගම 2005 වර්ෂයේ දී රාජ්‍ය ව්‍යවසායක් බවට පත් කරන ලදී. මෙම ආයතනය සතුව පොල්, රබර් ඇතුළු භෝග වගාවන් සහිත වතු 07 ක් පවතින අතර එහි මුළු භූමි ප්‍රමාණය අක්කර 12,230.69 කි. මූල්‍යමය වශයෙන් ස්ථාවර මෙම ආයතනය මඟින් ප්‍රධාන වශයෙන් පොල්, රබර් ඇතුළු භෝග වගා කිරීම, අගය එකතු කරන ලද නිෂ්පාදන බිහිකිරීම, එම නිෂ්පාදන සැකසීම සහ අලෙවිය යන අංශයන් වෙත අවධානය යොමු කර ඇත

දැක්ම

ගිනිකොණදිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂි ව්‍යාපාර කළමණාකාරීත්ව සමාගම බවට පත්වීම.

මෙහෙවර

ස්වාභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහාගෙන වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායී ලෙසත්, ලාභදායී ලෙසත්, තිරසාර ලෙසත් කළමණාකරණය කරමින් සියළු ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

2023.12.31 දිනට ක්‍රියාත්මක සැලැස්මට අනුව ව්‍යාපෘති ප්‍රගතිය

විස්තරය	භෞතික			මූල්‍ය (ආදායම)	
	ඒකකය	වාර්ෂික ඇස්තමේන්තුව	ප්‍රගතිය	වාර්ෂික ඇස්තමේන්තුව (රු.මිලි.)	ප්‍රගතිය (රු.මිලි.)
පශු සම්පත් ව්‍යාපෘතිය	කිරි කිලෝ	37,230	11,463	4.46	1.71
පොල් තෙල් ව්‍යාපෘතිය	ලීටර්	6,000	10,426	4.84	9.27
අලෙවි සැල්	ගණන	5	5	20.02	73.53

ක්ෂේත්‍ර කාර්යයන්	භෞතික			මූල්‍ය	
	ඒකකය	වාර්ෂික ඉලක්ක	භෞතික ප්‍රගතිය	වාර්ෂික ප්‍රතිපාදන (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
අළුතින් වැටවල් ඉදි කිරීම	මීටර්	16,400	16,752	27.51	20.28
වැටවල් අළුත්වැඩියා කිරීම	මීටර්	28,370	43,694	4.83	4.62
යටි වගා කිරීම	පැල ගණන	3,348	3,027	16.60	17.01
පොල් පැල නැවත සිටුවීම	පැල ගණන	4,810	5,708	5.65	4.86
පරිණත වගාව සඳහා පොහොර යෙදීම	ගස් ගණන	71,627	34,197	68.41	23.15
අළුතින් කාණු කැපීම	මීටර්	4,250	3,750	0.96	0.66
පැරණි කාණු ගොඩ දැමීම	මීටර්	2,820	3,620	-	
පොල් අතු වසුන්	ගස් ගණන	413,180	425,820	3.15	3.49
පොල් ලෙලි වලවල් කැපීම	වලවල් ගණන	14,340	14,119	8.01	7.63

(මූලාශ්‍රය -සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

2023.12.31 දිනට වගා කල භූමි ප්‍රමාණය

භෝගය	භෞතික		
	ඒකකය	වාර්ෂික ඉලක්කය	ප්‍රගතිය
පොල් යටි වගා	හෙක්ටයාර	22.32	19.46
පොල් පැල පාළු සිටුවීම	පැල ගණන	4,810	5,392
පොල් පැල තවාන්	පැල ගණන	36,700	22,000
දැව	පැල ගණන	4,350	4,350
කුරුඳු	පැල ගණන	35,300	35,300
අඹ	පැල ගණන	3,500	600 **
කහ	හෙක්ටයාර	5.67	1.21
ඩ්‍රැගන් පෲට්	පැල ගණන	1,000	1,000
දෙහි	පැල ගණන	2,000	2,000
කජු	පැල ගණන	320	320
රඹුටන්	පැල ගණන	500	500

(මූලාශ්‍රය - සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

** අදාල ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

භෝග නිෂ්පාදන තොරතුරු - 2023.12.31 දිනට ප්‍රගතිය

භෝගය	භෞතික				මූල්‍ය		
	ඒකකය	වාර්ෂික ඉලක්කය	ප්‍රගතිය	%	වාර්ෂික ඉලක්කය (රු.)	ප්‍රගතිය	%
පොල්	ගෙඩි	17,000,000	12,938,759	76	929,600,000	811,898,229	87
රබර්	කිලෝ	126,756	85,350	67	69,715,800	43,122,134	62
කජු	කිලෝ	47,607	40,784	86	28,422,700	24,462,207	84
අඹ	කිලෝ	36,235	44,051	122	16,280,750	15,522,586	95
රඹුටන්	ගෙඩි	3,797,125	1,213,304	32	10,554,594	11,014,137	104
කුරුඳු	කිලෝ	6,355	5,149	81	23,062,000	15,984,928	69
ගම්මිරිස්	කිලෝ	11,761	3,474	30	19,993,700	5,416,347	28
අලි පේර	ගෙඩි	800	1574	197	40,000	124,321	310
කහ	කිලෝ	130,800	1936	1	18,270,000	699,854	4
ඩ්‍රැගන් ෆෘට්	කිලෝ	7,424	6,154	83	2,969,600	2,837,818	95
කොකෝවා	කිලෝ	4,100	1860	45	1,968,000	1,122,005	57
කෝපි	කිලෝ	100	110	110	100,000	214,215	214
මැංගුස්	ගෙඩි	10,000	225	2	120,000	5,625	5
පේර	කිලෝ	2,650	1496	56	419,500	331,682	68
පුවක්	ගෙඩි	140,000	47,229	34	290,000	219,248	76
පුවක්	කිලෝ	119	52	44	101,150	68,800	68
දුරියන්	ගෙඩි	16,190	1,294	8	3,642,750	421,755	12
පේර පැල	පැල	400	62	16	64,000	15,500	24
කෙසෙල්	කිලෝ	2,500	1,145	46	187,500	229,590	122

(මූලාශ්‍රය - සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

විවිධ ආදායම් - 2023.12.31 දිනට

විස්තරය	භෞතික			මූල්‍ය (ආදායම)	
	ඒකකය	වාර්ෂික ඇස්තමේන්තුව	ප්‍රගතිය	වාර්ෂික ඇස්තමේන්තුව (රු.)	ප්‍රගතිය (රු.)
පොල් ගස් අලෙවිය	ගස් ගණන	6,750	3,793	44,060,000	14,490,751
රබර් ගස් අලෙවිය	ගස් ගණන	2,000	2,574	7,000,000	26,682,680
දර අලෙවිය	මීටර්	2,600	6,493	1,545,750	1,843,458
දැව ගස් අලෙවිය	ගස් ගණන	2,794	258	29,896,000	8,014,687
තැඹිලි ගෙඩි අලෙවිය	ගෙඩි	3,600	3,745	93,000	220,575
පොල් ලෙලි අලෙවිය	ලෙලි ගණන	8,500,000	5,337,456	28,600,000	12,680,049
පොල් කටු/ අඟුරු අලෙවිය	පොල් කටු ගණන	184,000	193,649	622,500	644,172
ගවයින් අලෙවිය	ගණන	18	20	2,164,500	2,660,246

(මූලාශ්‍රය - සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	2023 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.)	ප්‍රගතිය (රු.)	%
ප්‍රාග්ධන	476,298,836	250,226,165	52
පුනරාවර්තන	297,154,919	273,445,300	92

(මූලාශ්‍රය - සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

2023.12.31 වන විට රු.මි. 1,010.95 ක ආදායමකුත්, රු.මි. 534.43 ක බදු පෙර ලාභයකුත් වාර්තා කිරීමට සමත්ව ඇත.

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- සුදු මැස්සා පාලනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීම
- ජල සම්පාදන ක්‍රම ව්‍යාප්ත කිරීම
- අලෙවිසැල් ජාලය ව්‍යාප්ත කිරීම හා පොල් අයිස්ක්‍රීම් ඇතුලු සමාගමේ නිෂ්පාදන ඒ හරහා අලෙවි කිරීමට කටයුතු කිරීම
- කුරුඳු කොල වලින් කුරුඳු තෙල් නිස්සාරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
- නව මුර නිවාස 05 ක් සහ ස්ථාන භාර නිළධාරි නිල නිවාස 01 ක් ඉදි කර අවසන් කිරීම.
- සුදු පොල් තෙල් සහ නැවුම් පොල් තෙල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- කුරුඳු වගාව සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් දොඩම්ගස්ලන්ද පළාත් වතුයායට GAP සහතිකය (යහපත් කෘෂිකාර්මික පිළිවෙත්) ලබා දී ඇත.
- කාබනික කෝපි සහ කුරුඳු සැකසීම සඳහා කාබනික සහතිකය ලබා ගෙන ඇත.
- දුරියන්, රඹුටන්, අනෝදා සහ මිරිස් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් දොඩම්ගස්ලන්ද පළාත් වතුයායට GAP සහතිකය (යහපත් කෘෂිකාර්මික පිළිවෙත්) ලබා දී ඇත.





2024 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- නාරම්මල පළාත් වතුයායේ ඔළියදෙණිය බෙදුමේ තාක්ෂණික පුරයක් ආරම්භ කිරීම.
- පොල් අයිස්ක්‍රීම් නිෂ්පාදනය පුලුල් කිරීම සඳහා කර්මාන්තශාලාවක් ප්‍රධාන කාර්යාල භූමියේ ආරම්භ කිරීම.
- කටුගම්පොල පළාත් වතුයායේ කොහු නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
- කටුගම්පොල පළාත් වතුයායේ කපු සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
- හිරියාල පළාත් වතුයායේ පළතුරු බීම නිෂ්පාදන කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම
- කුරුණෑගල පළාත් වතුයායේ ධාන්‍ය සැකසුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම
- වගා වැඩසටහන යටතේ පහත සඳහන් වගාවන් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

බෝගය	ඒකකය	ප්‍රමාණය
පොල් යටි වගා	පැල	6,992
පොල් පාලු සිටුවීම	පැල	6,210
පොල් පැල තවාන්	පැල	32,000
දැව ගස් සිටුවීම	පැල	3,550
තේ පැල සිටුවීම	හෙක්ටයාර්	4.00
කුරුඳු පැල සිටුවීම	පැල	32,992
අඹ පැල සිටුවීම	පැල	2,600
කෝපි පැල සිටුවීම	පැල	1,000
පේර පැල සිටුවීම	පැල	2,000

(මූලාශ්‍රය - සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

❖ පහත සඳහන් ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

ක්ෂේත්‍ර කාර්යය	ඒකකය	ප්‍රමාණය
අළුතින් වැටවල් ඉදි කිරීම	මීටර්	10,400
වැටවල් අළුත්වැඩියා කිරීම	මීටර්	22,850
යටි වගා කිරීම	පැල ගණන	6,992
පොල් පැල පාලු සිටුවීම	පැල ගනන	6,010
පරිණත වගාව සඳහා පොහොර යෙදීම	ගස් ගණන	143,466
අළුතින් කාණු කැපීම	මීටර්	5,000
පැරණි කාණු ගොඩ දැමීම	මීටර්	8,317
පොල් අතු වසුන් යෙදීම	ගස් ගණන	398,973
පොල් ලෙලි වලවල් කැපීම	වලවල් ගණන	19,015

(මූලාශ්‍රය - සී/ස කුරුණෑගල වැවිලි සමාගම)

❖ සහකාර වතු අධිකාරි නිල නිවසක්, ස්ථාන භාර නිළධාරි නිල නිවාස 02 ක්, මුර නිවාස 05 ක් සහ පෙරෙට්ටු මඩුවක් ඉදිකිරීමට ද නියමිතය.

04. සී/ස හලාවත වැවිලි සමාගම

හැඳින්වීම

1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ හලාවත වැවිලි සමාගම පොදු සමාගමක් බවට පත් කර 1982 අංක 17 හා 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදි. සමාගම් ලියාපදිංචි අංකය PB 703 වේ.

අංක 718/16 හා 1992/6/11 දරණ ගැසට් පත්‍රය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු ඇතුලත් වැවිලි වත්කම් හලාවත වැවිලි සමාගමට පවරන ලදි. මේ වන විට රු.මි. 3,114 ඉක්මවූ වත්කමකට හිමිකම් කියනු ලබයි.

දැක්ම

පොල් ඇතුළු වැවිලි කර්මාන්තයේ තිරසර සංවර්ධනය මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබාදීම.

මෙහෙවර

පොල් ඇතුළු වැවිලි කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා තමන් සතු සීමිත සම්පත් ඵලදායි ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිතා කරමින්, විදේශ වෙළඳපොල සඳහා අගය එකතු කළ නිෂ්පාදන යොමු කරමින් පිළිගත් ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ සහ මහජනතාවගේ ජීවන තත්වය නංවාලීම.

2023 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2023.12.31

සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්	ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (රු.මි)	සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය (2023)	භෞතික ප්‍රගතිය (%)	ලබා ගත් ආදායම (රු.මි)
භෝග නිෂ්පාදන තොරතුරු						
පොල්	591	544	92%	14,710,000 (ගෙඩි)	80% (ගෙඩි මි.11.7)	704
කජු	43	47	109%	162,200 Kg	ගස් බදු දීම මඟින් ආදායම උපයා ගැනීම සිදු කරයි	34
ගම්මිරිස්	2	0.41	20.5%			-
රඹුටන්	0.7	0.17	24.3%			2.1
කුරුඳු	3.5	1.6	45.7%	1,000 Kg	47%	1.5
ඩ්‍රැගන්ෆෘට්	0.6	0.1	16.7%	2,950 Kg	50%	0.6
අඹ	0.48	0.14	29.2%	350Kg	107%	0.07
කෙසෙල්	0.03	0.19	633%	1,900Kg	3%	0.008
කර්මාන්ත තොරතුරු						
පොල් තෙල්	25	17	68%	28,800Kg	60%	15.38
පිරිසැකසුම් කළ කජු	20.7	13.3	64%	5,300Kg	58%	14.7
විශේෂ ව්‍යාපෘති						
ඒකාබද්ධ පොල් නිෂ්පාදන කර්මාන්ත ශාලාව	255	ක්‍රියාත්මක කිරීමට සියල්ල සූදානම් කර ඇති අතර අදාල අංශවල අනුමැතිය පමණක් අපේක්ෂා කෙරේ.				
ජල සම්පාදන ව්‍යාපෘතිය	100	50% අවසන් කර ඇත				
සූර්ය බල උත්පාදක ව්‍යාපෘතිය (මෙගා වොට් 20)		ආයෝජකයින් සමඟ ගිවිසුම් අත්සන් කර ඇති අතර ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතය. ඒ සඳහා රු. මි. 8000ක් පමණ ආයෝජනය කෙරෙන අතර ඉන් 18%ක කොටසක් හලාවත වැවිලි සමාගම සතුවේ.				

(මූලාශ්‍රය - සී/ස හලාවත වැවිලි සමාගම)

මූල්‍ය ප්‍රගතිය - 2023.12.31 දිනට

විස්තරය	වෙන්කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)
ප්‍රාග්ධන වියදම්	581	118
පුනරාවර්තන වියදම් (මූල්‍ය පිරිවැය හැර)	958	877

(මූලාශ්‍රය - සී/ස හලාවත වැවිලි සමාගම)

2023.12.31 වන විට රු.මි. 900 ක අයභාරයකුත්, රු.මි. 302 ක බදු පෙර ලාභයකුත් වාර්තා කිරීමට සමත්ව ඇත.

වගා කල භූමි ප්‍රමාණය

භෝගය	වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.)		
	2023 ඉලක්කය	2023.12.31	
		ඉලක්කය (%)	ප්‍රගතිය (%)
පොල්	47.00	100	91

(මූලාශ්‍රය - සී/ස හලාවත වැවිලි සමාගම)

2023 වර්ෂයේ ක්‍රියාත්මක කළ වෙනත් විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

- මෙගා වොට් 20ක සූර්ය පැනල ව්‍යාපෘතියට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇති අතර එමඟින් ආයතනයේ ආදායම ඉහළ නැංවීමට කටයුතු කර ඇත. රු. මිලියන 8000ක ආයෝජනයකින් පෞද්ගලික ව්‍යවසායකයින් සමඟ මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට ගිවිසුම් ගත වී ඇති අතර ඉන් 18% ක කොටසක් හලාවත වැවිලි සමාගම සතු වේ.
- හලාවත වැවිලි සමාගමේ කපු සඳහා SLS 1324 කාබනික සහතිකය සහ යුරෝපීය රටවල් සඳහා අවශ්‍ය වන EU කාබනික සහතිකය ලබා ගැනීමට සමත් වී ඇත.
- පෞද්ගලික අංශ සමඟ ඒකාබද්ධව අක්කර 1500ක අතුරු භෝග වශයෙන් එළවළු වගා ආරම්භ කර ඇත.(වම්බටු, තිබ්බටු, බණ්ඩක්කා, මාළු මිරිස්, මැකරල්, පතෝල, කැකිරි, දුම්කොළ වගාවන් ස්ථාපිත කර ඇත.)

- බිංදු ජල සම්පාදන ව්‍යාපෘතියේ අක්කර 100ක ප්‍රමාණයක් මේ වන විට අවසන් කර ඇති අතර තව අක්කර 400ක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

- වාණිජ මට්ටමේ තවාන් ව්‍යාපෘතිය මඟින් දිවයිනේ පොල් වගාවේ නියැලෙන්නන් හට අවශ්‍ය උසස් තත්ත්වයේ පොල් පැළ ලක්ෂ 5ක් මේ වන විට ලබා දේ.

- පොල් පැණි නිෂ්පාදනය ආරම්භ කර තවදුරටත් සිදු කරන අතර ගුණාත්මයෙන් උසස් නිමි ද්‍රව්‍ය වෙළඳපොළට ලබා දෙයි.

- යාපනය ප්‍රදේශයේ පොල් ත්‍රිකෝණය ආරම්භ කිරීමට අදාළ කටයුතු සිදු කිරිම.

- වතු ජනතාව හා ආයතනයේ සේවක මහත්ම මහත්මීන් සඳහා ශ්‍රම අභිමානී ඇතුළු වැඩසටහන් මඟින් දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කරනු ලබයි.
  උදා :- සියළු පාසල් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීම/ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීම/වතු සේකයින්ට ගෙවතු වගා කිරීමට ඉඩම් අක්කරයක් ලබා දීම.

- පොල් වගා කිරීමට කැමැත්තක් ඇති එහෙත් හැකියාවක් නොමැති ඉඩම් හිමියන්ගේ එම වගා කටයුතු හලාවත වැවිලි සමාගම මඟින් සිදු කර දෙනු ලබයි.

- සහන මිලට පොල් හා පොල් තෙල් රාජ්‍ය ආයතන වෙත අලෙවි කරමින් මහජනතාවට උසස් තත්ත්වයේ ද්‍රව්‍ය ලබාදීමට පියවර ගෙන ඇත.

- වැව් හා පතස් පිළිසකර කිරීම මඟින් ජල සංචිත එක්රැස් කර ගැනීමටත්, එමඟින් වගාවන්ගේ තත්ත්වය උසස් ලෙස පවත්වා ගැනීමටත් පියවර ගෙන ඇත.

- පොල් ආශ්‍රිත විවිධ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන හලාවත වැවිලි සමාගමේ අලෙවිසැල් හරහා අලෙවි කිරීමටත්, එසේ නිෂ්පාදනය කරනු ලබන ද්‍රව්‍ය සඳහා අමුද්‍රව්‍ය හලාවත වැවිලි සමාගම මඟින් ලබා දීමටත් කටයුතු කර ඇත.

- අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයන වෙළඳපොලට නිකුත් කිරීම ඉලක්ක කොට ඒකාබද්ධ පොල් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කර, සමස්ථ පොල් නිෂ්පාදනය ඒ සඳහා යොමු කර ඩොලර් මිලියන 5ක පමණ විනිමය ආදායමක් ඉපැයීම අපේක්ෂා කෙරේ. සියලු කටයුතු මේ වන විට සම්පූර්ණ කර ඇති අතර අදාළ අංශවල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- වැවිලි ක්ෂේත්‍රයේ බහුතර සේවක සංඛ්‍යාවකින් ඉහළ දීමනා හා පහසුකම් ලබන සේවක පිරිසක් බවට හලාවත වැවිලි සමාගමේ සේවක පිරිස පත් කිරීම.

2024 වර්ෂයේ දී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ක්‍රියාකාරකම්

❖ සූර්ය සහ සුළං බලශක්ති ව්‍යාපෘති දෙකක් උතුරු ප්‍රදේශයේ ආරම්භ කිරීමට නියමිතය.

❖ තවාන් ව්‍යාපෘතිය යාපනය දිස්ත්‍රික්කයට ව්‍යාප්ත කරමින් නව පොල් ත්‍රිකෝණයේ නව පොල් වගාව දියුණු කිරීමට අපේක්ෂිතය.

❖ අභය එකතු කිරීමේ කර්මාන්ත ශාලාව පෞද්ගලික ව්‍යවසායකයින් සමඟ එක්ව ක්‍රියාත්මක කර 2024 ජූලි මස වන විට නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය.

❖ නව බිංදු ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීම මඟින් පොල් වගාවට අවශ්‍ය ජලය ලබා දීමටත් එමඟින් ඵලදාව ඉහළ දැමීමටත් අපේක්ෂා කරන අතර, 2024 වසර තුළ අක්කර 200ක පමණ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

❖ කිණියම වතු කලාපයේ පවතින කප්රුවන බීජ පොල් උයන මඟින් පැළ නිපදවා ගොවියන් වෙත ලබා දීම තවදුරටත් වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

❖ පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා,

- පොල් ගස් ගහණය වැඩි කිරීම.
- ඵලදාව වැඩි කිරීම.
- ගසකට ගෙඩි ප්‍රමාණය වැඩි කිරීම.

ඉහත කරුණු කෙරෙහි දැඩි අවධානය යොමුකරමින් යහපත් කෘෂි කාර්මික පිළිවෙත් (GAP) සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඉදිරි වසර තුළ පොල් අස්වැන්න 30% - 40% ප්‍රමාණයකින් වැඩි කිරීම සහ ගසකින් ලැබෙන ගෙඩි ප්‍රමාණය 70ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

❖ 2024 වර්ෂයේදී යටි වගාවන් වශයෙන් හෙක්ටයාර් 50ක යටි වගාවන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

❖ අපනයන සඳහා අතුරු භෝග විශේෂ ව්‍යාපෘතිය
ඉඩමේ උපරිම ඵලදායිතාව ලබා ගැනීම සඳහා වැඩි වෙළඳපල වටිනාකමක් සහ ඉල්ලුමක් ඇති ශාක වර්ග වගා කිරීමේ නව වැඩ සටහනක් හලාවත වැවිලි සමාගම මඟින් ආරම්භ කරන ලදී. ආරම්භයේදී අක්කර 300ක පමණ ප්‍රදේශයක මෙම පැළ සිටුවීම අපේක්ෂා කෙරේ.

❖ අලෙවි ජාලය පුළුල් කිරීම.
හලාවත වැවිලි සමාගමේ නිෂ්පාදන දිවයින පුරා අලෙවි කිරීම සඳහා දැනට අලෙවි නියෝජිතයින් 50ක පමණ ප්‍රමාණයක් පත් කර ඇති අතර මෙය 2024 වර්ෂයේදී 100 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රධාන පාරිසරික ගැටළුවක් වන අතිශයෙන් ඉහළ උෂ්ණත්වයක් සහිත දිගු වියළි කාලගුණය අවම කිරීමේ පහත උපාය මාර්ග අනුගමනය කිරීමට නියමිතයි.

- වැසි ජලය ගබඩා කිරීම සඳහා පොකුණු/වැව් ප්‍රතිසංස්කරණය කිරීම.
- තෙතමන සංරක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කිරීම.
- නවීන වාරි පද්ධති ස්ථාපිත කිරීම.

- නවීන වාරි පද්ධති ස්ථාපිත කිරීම.

❖ වන කළමණාකරණ සැලස්ම
2024 වර්ෂයේ තේක්ක පැළ 10,000ක් හා මී, හොර, නැදුන් පැළ සිටුවීමට සැලසුම් කිරීම.

❖ නව නිෂ්පාදන 10ක් වෙළඳ පොළට හඳුන්වා දීම.
❖ රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ සෙසු සියලු ආයතන අභිබවමින් ඉහළ ලාභාංශ කොටසක් මහා භාණ්ඩාගාරය වෙත ලබා දීමට කටයුතු කිරීම.

❖ ඌනමූන, පලුගස්වැව, ගල්වගාර යන වතු කොට්ඨාශවල පරිසර හිතකාමී සංචාරක ව්‍යාපෘති ආරම්භ කිරීම

❖ පලුගස්වැව වතුයාය ආදර්ශ උද්‍යානයක් බවට පත් කිරීම.

05. සී/ස ඇල්කඩුව වැවිලි සමාගම

හැඳින්වීම

ඇල්කඩුව වැවිලි සමාගම 1993 ජූලි 23 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන්ම රජයට අයත් ආයතනයක් ලෙස පිහිට වූ සහ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යලි ලියාපදිංචි වූ සීමාසහිත වගකීම් සමාගමකි. 1987 දී අංක 23 දරණ රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණ පනත යටතේ පොදු සමාගම් බවට පත්කරනු ලබන විධිවිධානය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් කළමනාකරණය කරන ලද ඉඩම් පවරා ගැනීමෙන් සමාගම ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ රන් කොටස් හිමියා වන තනි කොටස් හිමියන්ගේ සමාගමක් ලෙස සමාගම ක්‍රියාත්මක වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය “ජනවතු පියස”, අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇති අතර කෝප් කමිටුවේ නිර්දේශ ප්‍රකාරව 2020 නොවැම්බර් මස ප්‍රධාන කර්යාලය මාතලේ, උකුවෙල පිහිටි රත්වත්ත වතුයාය වෙත ගෙනයන ලදී.

වර්තමානය වන විට සමාගම මගින් බන්ඩරපොල, ඇල්කඩුව, හුණුගල, හපුගස්පිටිය, නාලන්ද, මිල්ලවාන, රත්වත්ත හා සැලගම යන වතුයයන් පාලනය කරනු ලැබේ.

දැක්ම

ශ්‍රී ලංකාවේ වඩාත් විවිධාංගීකරණය වූ වැවිලි සමාගම බවට පත්වීම.

මෙහෙවර

ජාතික ආර්ථිකයට දායකවන වගකිවයුතු, අභිප්‍රේරිත හා කැපවූ සේවක මඩුල්ලක් තුලින් යහපත් කළමනාකරණ භාවිතයන් සහ විද්‍යාත්මක තාක්ෂණයන් අනුගමනය කරමින් සියලුම පාර්ශවයන්ට ඉහළ ප්‍රතිලභ ලැබෙන පරිදී වෙළෙඳපොළට උසස් තත්වයේ නිෂ්පාදන යොමු කිරීම හා ණයහිමියන්ට කඩිනමින් ගෙවීම් ලබා දීම.

2023 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය

අයිතමය	2023 වර්ෂය ප්‍රගතිය (රු.මි.)
පිරිවැටුම	447,593,687
විකුණුම් පිරිවැය	(393,057,489)
දළ ලාභය / අලාභය	54,536,197
වෙනත් ආදායම්	105,006,140
ජීව විද්‍යාත්මක වත්කම්වල අගය වෙනස් වීම මත ඇතිවන ලාභය	242,654,986
පරිපාලන වියදම්	(72,520,333)
වෙනත් වියදම්	(1,545,208)
මූල්‍ය වියදම් (ශුද්ධ)	(13,234,292)
බදු පිරිවැය	(6,136,738)
රාජ්‍ය ප්‍රදාන	-
වෙනත් විස්තීරණ ආදායම්	-
කාලඡේදයේ ලාභය / අලාභය	308,760,751

(මූලාශ්‍රය - සී/ස ඇල්කඩුව වැවිලි සමාගම)

2023 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම් ප්‍රගතිය

සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම්	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	සමස්ත වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
පවතින තේ වතුයායන් 06 තුළ වසරකට හෙක්ටයාර 02 බැගින් සම්පූර්ණ හෙක්ටයාර 12 ක පමණ නව තේ වගා ඇති කිරීම. (2023/24 ඊශාන දිග මෝසම තුළ ක්‍රියාත්මක කෙරේ.)	16.2	0.09	0.56%	5%
හපුගස්පිටිය, මිල්ලවාන සහ නාලන්ද යන වතුයායන් 03 හි හෙක්. 23.84 ක බද්ධ රබර් වගාවක් සිදු කිරීම.	-	-	*	72%
හපුගස්පිටිය සහ මිල්ලවාන,රත්වත්ත,නාලන්ද වතුයාය 04 හි දැනටමත් වගා කොට ඇති නොමේරූ රබර් වගාවන් නිසි පරිදි පවත්වා ගැනීම.	12.2	8.7	71%	100%
මිල්ලවාන සහ හපුගස්පිටිය වතුයායවල හෙක්. 47.58 ක පොල් වගාවක් නිසි පරිදි පවත්වා ගැනීම.	22.2	5.5	24%	50%
වතුයායන් 9 ට අදාළව වගා වපසරිය හෙක්ටයාර 110 ක් ආවරණය වන පරිදි පැළ 60,0000ක වාණිජමය වන වගාවක් සිදු කිරීම. (2024 වසර තුල දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.)	3.5	-	-	-
වතුයාය නවය තුළ ක්‍රියාත්මක දැනට වගා වපසරිය හෙක්ටයාර 81.25ක් වූ වන වගාව නිසි ලෙස නඩත්තු කිරීම.	21.0	6.5	30%	100%
මුළු වපසරිය හෙක්. 2ක් වන රත්වත්ත සහ සැලගම වතුයායවල පවතින නොමේරූ කුරුඳු වගාව නිසි ලෙස නඩත්තු කිරීම.	1.3	0.52	40%	100%
හුණුගල වතුයායේ හෙක්ටයාර 02ක නව කරාඹු වගාවක් ආරම්භ කිරීම.(2023/24 ඊශාන දිග මෝසම තුළ ක්‍රියාත්මක කෙරේ.)	0.64	-	-	-
බණ්ඩාරපොළ, ඇල්කඩුව, රත්වත්ත වතුයායවල දැනට ආරම්භ කර ඇති හෙක්. 11.9ක වගා වපසරියක් සහිත නොමේරූ කරාඹු වගාව නිසි ලෙස නඩත්තු කිරීම. (නොමේරූ කරාඹු වගාව නිසි ලෙස නඩත්තු කර අවට ක්ෂේත්‍රය පිරිසිදු කිරීම ආරම්භ කර ඇති අතර 2024 වසර තුලදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.)	3.3	0.02	1%	10%
බණ්ඩාරපොළ වතුයායේ හෙක්ටයාර 02ක් පමණ නොමේරූ පුවක් වගාව නිසි පරිදි නඩත්තු කිරීම.	0.41	0.40	97%	100%
බණ්ඩාරපොළ සහ ඇල්කඩුව වතුයායවල වගා වපසරිය හෙක්ටයාර 02ක් පමණ වූ නව කොපි වගාවක් ආරම්භ කිරීම.	-	-	*	100%
ඇල්කඩුව වතුයායේ හෙක්.1.5ක් පමණ වූ නව දුරියන් වගාවක් ආරම්භ කිරීම.	-	-	*	100%
නාලන්ද වතුයායේ හෙක්ටයාර 8.4ක වපසරියකින් යුතු නව කජු වගාවක් ආරම්භ කිරීම.(2023/24 ඊශාන දිග මෝසම තුළ ක්‍රියාත්මක කෙරේ)	5.4	1.6	29%	30%
ඇල්කඩුව වතුයායේ හෙක්ටයාර 2ක් පමණ වූ නව එනසල් වගාවක් ආරම්භ කිරීම.	2.8	0.9	32%	100%
බණ්ඩාරපොළ වතුයායේ හෙක්ටයාර 3.12ක් පමණ වූ නව ගම්මිරිස් වගාවක් ආරම්භ කිරීම.	1.2	-	-	-
වසරකට නිමි කිලෝ ලක්ෂයක ධාරිතාවයක් සහිත ඇල්කඩුව වතුයායේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.	2.9	-	-	-
එකතුව	**93.05**	**24.23**	**26%**	**60%**

(මූලාශ්‍රය - සී/ස ඇල්කඩුව වැවිලි සමාගම)

* ශ්‍රමදාන හා ආශ්‍රිත ක්‍රියාකාරකම් මඟින් සිදු කිරීම

- සෙම්බුවත්ත සංචාරක ව්‍යාපෘතිය මගින් විනෝදාත්මක සහ ත්‍රාසජනක ක්‍රියාකාරකම් අළුතින් හඳුන්වා දීම, සමාජ මාධ්‍ය ජාල මගින් පුළුල් ප්‍රචාරණයක් ලබා දීම, ඉහළ පෙළ ගැනුම්කරුවන් සඳහා විශේෂිත අවන්හලක් ආරම්භ කිරීම, පවතින සංචාරක බංගලාව නවීන පහසුකම් සහිතව වැඩි දියුණු කිරීම ආදී උපාය මාර්ග මගින් වාර්ෂික ශුද්ධ අදායම් ඉලක්කය රු.මි.88ක් උපයන ව්‍යාපාරික ඒකකයක් ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ. මේ වන විට රු.මි. 40 ක අදායම් ඉලක්කයක් සපුරා ගෙන ඇත.

- වතුයායන් හා සබැඳුණු "හුලංගල"සහ "වන් ට්‍රී හිල් " සංචාරක නැරඹුම් ස්ථාන අදායම් උත්පාදනය කරනු ලබන නව ප්‍රභවයන් ලෙස සංවර්ධනය කිරීම තුලින් "හුලංගල" නැරඹුම් මධ්‍යස්ථානයෙන් රු. මි.8.1 ක අදායම් ඉලක්කයක් සහ "වන් ට්‍රී හිල් " නැරඹුම් මධ්‍යස්ථානයෙන් රු.මි. 1.2 ක අදායම් ඉලක්කයක් සපුරා ගෙන ඇත.

- පරිණත දැව අලෙවියෙන් වාර්ෂික අපේක්ෂිත ආදායම් ඉලක්කය වන රු.මි.287ක් උපයා ගැනීමට උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති අතර මේ වන විට රු.මි.27.3 ක ආදායම් ඉලක්කයක් සපුරා ගෙන ඇත.

2024 වර්ෂයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම්

- පවතින තේ වතුයාය 06 තුළ වසරකට හෙක්ටයාර 02 බැගින් සම්පූර්ණ හෙක්ටයාර 12 ක පමණ නව තේ වගා ඇති කිරීම.

- හපුගස් පිටිය, මිල්ලවාන සහ නාලන්ද යන වතුයාය 3හි හෙක්ටයාර 30 ක බද්ධ රබර් වගාවක් සිදු කිරීම.

- මිල්ලවාන වතුයායේ හෙක්ටයාර 25 ක නව පොල් වගාවක් සිදු කිරීම.

- වතුයායන් 9 ට අදාළව වගා වපසරිය හෙක්ටයාර 110 ක් ආවරණය වන පරිදි ගස් 60,000 කින් යුත් වාණිජමය වන වගාවක් සිදු කිරීම.

- සෙම්බුවත්ත සංචාරක ව්‍යාපෘතිය මගින් විනෝදාත්මක ත්‍රාසජනක ක්‍රියාකාරකම් අළුතින් හඳුන්වා දීම, සමාජ මාධ්‍යජාල මගින් පුළුල් ප්‍රචාරණයක් ලබා දීම, ඉහළ පෙළේ ගැනුම්කරුවන් සඳහා විශේෂිත අවන්හලක් ආරම්භ කිරීම, පවතින සංචාරක බංගලාව නවීන පහසුකම් සහිතව වැඩි දියුණු කිරීම ආදී උපාය මාර්ග මගින් වාර්ෂික ශුද්ධ ආදායම් ඉලක්කය රු.මි.120 ක් දෙනු ලබන ව්‍යාපාරික ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම.

- දැනට ක්‍රියාත්මක "හුලංගල "සහ " වන් ට්‍රී හිල් " සංචාරක නැරඹුම් ස්ථාන ආදායම් උත්පාදනය කරනු ලබන නව ප්‍රභවයන් ලෙස සංවර්ධනය කිරීම හා වාර්ෂිකව රුපියල් මිලියන 20 ක් උත්පාදනය කරනු ලබන ව්‍යාපෘති ලෙස සංවර්ධය කිරීම.

- දැනට නීතිමය කටයුත්තක් හේතුවෙන් තාවකාලිකව වසා දමා ඇති රත්වත්ත තේ කම්හල නැවත ක්‍රියාත්මක කොට නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව හා එක්ව අක්කර 25ක පමණ වපසරියක යටි වගාවක් ලෙස කොකෝවා වගා කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

06.සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

හැඳින්වීම

කළුබෝවිටියාන තේ කර්මන්තශාලාව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමිත බැඳීම් සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබුවේ සීටීසී තේ නිපදවීම සඳහා වන අතර, 1994 අගෝස්තු 1 වන දින වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉන්දීය ණය ආධාර යටතේ ආරම්භක ප්‍රාග්ධනය සපයන ලදී. ඒ අන්දමින් ම ඉන්දීය ණය ආධාර යටතේ එහි දෙවන තේ කර්මාන්තශාලාව වූ දැරංගල තේ කර්මාන්ත ශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මසදී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. පෙර තේ ශක්ති අරමුදල යටතේ පැවති එහි තෙවන කර්මාන්තශාලාව වූ හිනිඳුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව ලාභ බෙදාහදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පවරන ලදී. තමන්ගේම අරමුදල් යොදාගනිමින් සමාගම මෙම කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කරනු ලැබූ අතර හිනිඳුම තේ කර්මාන්තශාලාව 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අළුතින් ම එකතු වූ මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව පෙර තේ ශක්ති ආයතනයට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැණික්දිවෙල ගම්මානයේ පිහිටා ඇත. මෙම කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා සමාගම තමන්ගේම අරමුදල් භාවිතා කරන ලදී.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට අයත් ISO22000/2018 සහතික ලත් කර්මාන්ත ශාලා මඟින් ගෝලීය වෙළඳපොළ සඳහා උසස්ම තත්වයේ නැවුම් ලංකා තේ නිපදවන අතර එය දිවයිනේ ප්‍රමුඛතම සීටීසි තේ නිෂ්පාදකයා ලෙස කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ සුදුසුකම්වලට සැලකිය යුතු සන්නාම වටිනාකමක් එකතු කරයි. ලෝක මට්ටමේ තේ නිෂ්පාදකයෙකු වීම සඳහා වන සිය කැපවීම වෙර ගන්වමින් යහපත් නිෂ්පාදන පරිචයන්ට අතිරේකව, කළුබෝවිටියාන සමාගම ග්ලෝබල් GAP රාමුව, RA/UTZ ප්‍රමිති සහ මාර්ගෝපදේශ ඇතුළුව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත නිෂ්පාදන ව්‍යවහාරයන් යොදා ගෙන තිබේ.

සමාගමේ තේ නිපැයුමෙන් 90% ක් පමණ තැරැව්කරුවන් හරහා කොළඹ තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර, සුළු ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ, කර්මාන්තශාලාවල සහ අලෙවි අංශය මඟින් දේශීය වෙළඳපොළ තුළ අලෙවි කරනු ලැබේ.

දැක්ම

වඩාත් හොඳ ශ්‍රී ලාංකීය සීටීසී හා ඕතඩොක්ස් තේ නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ වඩාත් පිළිගත් ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් විශිෂ්ඨ තත්වයේ ප්‍රණීත හා පාරිභෝගිකයන්ට හිතකර ශ්‍රී ලාංකීය තේ නිෂ්පාදනය කිරීම.

2023 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය - (2023 මාර්තු 31 සිට 2024 ජනවාරි දක්වා)

කර්මාන්තශාලාව	ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි.)	සමස්ත වියදම (රු.මි.)	මුළු ආදායම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)	ශුද්ධ ආදායම (රු.මි.)
කළුබෝවිටියාන	1,438.08	914.17	1,048	63.29	85.97	118.32
දෑරංගල	442.06	269.13	227.27	47.19	57.29	(14.32)
හිනිදුම හිල්ස්	433.59	150.25	130.60	29.94	36.42	(31.54)
මැණික්දිවෙල	246.28	137.39	98.57	38.98	53.30	(27.90)
එකතුව						**44.56**

(මූලාශ්‍රය - සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම)

2023 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම් ප්‍රගතිය

- කර්මාන්තශාලා වෙත ප්‍රමිතිගත දළු ලබා ගැනීම සඳහා දළු හිමියන් තේ ක්ෂේත්‍රයන්හි වගා කිරීම සඳහා ප්‍රමිතිගත තේ පැළ තෝරා ගැනීම, වගා කිරීම, දළු නෙළීම, තේ ගස් කප්පාදු කිරීම හා පොහොර භාවිතා කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් පොහොර සමාගම්වල අනුග්‍රහය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පොහොර මිළ ගණන් ඉහළයාම හේතුවෙන් දළු හිමියන් තම ක්ෂේත්‍රයන් වෙත පොහොර නොයෙදීම නිසා ලැබෙන දළු කහ පැහැ වීම හා ප්‍රමිතියෙන් අඩු දළු නිෂ්පාදනය වීම හේතුවෙන් කර්මාන්තශාලා වෙත දළු සපයනු ලබන දළු හිමියන් වෙත පොහොර සහනදායී මිළකට ලබා දීමට කටයුතු කිරීම.

- B -60 ව්‍යාපෘතිය යටතේ කර්මාන්තශාලා වෙත ප්‍රමිතිගත දළු සපයනු ලබන සැපයුම්කරුවන් සඳහා තරු ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලද අතර, වර්ෂය අවසානයෙහි අදාල සැපයුම්කරුවන් ඇගයීමට ලක් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- කර්මාන්තශාලාවන්හි මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා වන ඉන්ධන වෙනුවෙන් වැය කරනු ලබන පිරිවැය අවම කරගැනීම සඳහා විකල්ප ඉන්ධන ප්‍රභවයක් ලෙස ග්ලිරිසීරියා භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම හා ඒ පිළිබඳව කුඩා තේ වතු හිමියන් හා ප්‍රවාහන නියෝජිතයින් දැනුවත් කිරීමට කටයුතු කිරීම.

- කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව සඳහා අඛණ්ඩව දළු සැපයුම් කරන කුඩා තේ වතු හිමියන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම අරමුණු කර කුඩා වතු හිමියන්ට අත්පොතක් මුද්‍රණය කර ලබාදීම.

2024 වර්ෂයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති / ක්‍රියාකාරකම්

- ❖ කර්මාන්තශාලාවන්හි මෙහෙයුම් කටයුතු සඳහා අධික ඉන්ධන පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළයාම අවම කිරීම හා ඉන්ධන භාවිතයෙන් වායු ගෝලයට එකතු වන කාබනික ප්‍රතිශතය අවම කිරීම අරමුණු කොට සූර්ය බලශක්ති පද්ධතියක් කළුබෝවිටියාන කර්මාන්ත ශාලාව සඳහා ස්ථාපිත කිරීම.

- ❖ කළුබෝවිටියාන කර්මාන්තශාලාව සඳහා වතුර පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කිරීම.

- ❖ කර්මාන්ත ශාලා දළු සැපයුම්කරුවන්ගේ තේ ක්ෂේත්‍රයන් පවත්වා ගෙන යායුතු ආකාරය පිළිබඳව ඔවුන් වෙත නවීන තාක්ෂණික දැනුම ලබා දීම අරමුණු කරගනිමින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ WhatsApp Group නිර්මාණය කර අවශ්‍ය තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

- ❖ කළුබෝවිටියාන හා හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලා වෙත දළු ප්‍රවාහනය සඳහා ට්‍රක් රථ මිළදීගැනීම සඳහා කටයුතු කිරීම.

- ❖ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ තේ ශ්‍රේණිගත කිරීමේදී නිමි තේ ශ්‍රේණියට අදාල සම්මත ප්‍රමාණයෙන් පමණක් ශ්‍රේණිගත කිරීමට හැකිවන ලෙස Vibro Screen යන්ත්‍ර ස්ථාපිත කිරීම.

- ❖ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව වෙත අවශ්‍ය වන සීටීසී කටර් මුවහත් කිරීමේ පරිගණකගත තාක්ෂණය සහිත CNC යන්ත්‍රයක් ස්ථාපිත කිරීම.

- ❖ දැරංගල තේ කර්මාන්ත ශාලාවෙහි සීටීසී වර්ගයේ තේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පද්ධතියක් ස්ථාපිත කිරීම.

- ❖ මැණික්දිවෙල හා හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලා වඩා ඵලදායී හා ලාභදායී කරවීම සඳහා එම එක් එක් තේ කර්මාන්තශාලාව ප්‍රමාණවත් අඛණ්ඩ තේ දළු සැපයුමක් ලබා ගැනීම වෙනුවෙන් එවැනි අඛණ්ඩ තේ දළු සැපයුමක් ඇති තේ වත්තක් හා එක් කර එම තේ වත්ත හා කර්මාන්තශාලාව යන දෙකම එකම කළමණාකාරිත්වයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසායන් විසින් සිදුකරන අපනයනාභිමුඛ වැවිලි කර්මාන්තයන්හි පොදු ප්‍රගතිය


තේ නිෂ්පාදනය


තේ වගාව 1867 දී ලූල්කදුර වතුයායෙන් ජේම්ස් ටේලර් සමාරම්භය සනිටුහන්කර අදට වසර 156ක් සම්පූර්ණ වී ඇති අතර ආරම්භයේ හෙක්ටයාර් 8 (අක්කර 19ක) තේ වගාවක් ලෙස ආරම්භ කර ඇත. මෙලෙස ප්‍රථමයෙන් වගා කළ තේ වගාවෙන් ලන්ඩන් තේ වෙලඳපොලේ දී ඉහළ මිලක් ලැබී ඇති අතර පසුව එය ක්‍රමයෙන් ව්‍යාප්ත වී වාණිජමය තේ වගාවත් ලෙස 1877 දී හෙක්ටයාර 1094 හා 1890 දී හෙක්ටයාර 89,100 ක් ලෙස ද, 1900 වන විට හෙක්ටයාර 155,520 දක්වා ද සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇත. මෙසේ තේ වගාව සීඝ්‍ර ලෙස වර්ධන වීමත් සමඟ ලංකා ආර්ථිකයේ වැදගත්ම වැවිලි භෝගය බවට පත් විය. 1930 දී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 185,085 දක්වා ද 1940 දී හෙක්ටයාර 223,074 දක්වා ද 1970 දී හෙක්ටයාර 241,986 දක්වා ද වර්ධනය වී ඇත. 1970 වන විට තේ නිෂ්පාදනය කිලෝ මිලියන 201.2 දක්වා වර්ධනය වී ඇත.කෙසේ වෙතත් මේ වන විට කිලෝ මිලියන 300ක පමණ තේ නිෂ්පාදනයක් සිදුවන අතර 2023 වසර අගදී තේ වල සමස්ථ අපනයන ආදායම ඇ.ඩො.මි.1.31 වී ඇත. එය 2022 එම අගය වූ ඇ.ඩො.මි.1.27 වඩා සුළු වර්ධනයකි.


තේ වගාවේ ප්‍රගතිය - (2017-2022)

ශීර්ෂය	ඒකකය	2017	2018	2019	2020	2021	2022
නිෂ්පාදනය	කි.ග්‍රෑ. මිලියන	307.1	303.8	300.1	278.9	299.5	251.5
මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	201	200	200	266	267	267
දළු කැඩීම සිදුකරන බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	193	193	193	266	267	267
නිෂ්පාදන පිරිවැය	රු./කි.ග්‍රෑ.	466.98	475.29	483.79	546.53	618.49	638.99
නැවත වගා කිරීම	හෙක්ටයාර	944	1,027	638	812	1,123	1,239
අලුතින් වගා කිරීම	හෙක්ටයාර	225	435	296	430	696	476

(මූලාශ්‍රය - 2022 මහ බැංකු වාර්තාව)


ජාතික තේ නිෂ්පාදනය (2019-2023)
තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන
310
300
290
280
270
260
250
240
230
220
2019
2020
2021
2022
2023
වර්ෂය
ජාතික තේ නිෂ්පාදනය


අමාත්‍යාංශය හා අනුබද්ධිත රාජ්‍ය ව්‍යවසායන්හි තේ නිෂ්පාදනයේ විචලනය (2019-2023)
තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ. මිලියන)
2
1.8
1.6
1.4
1.2
1
0.8
0.6
0.4
0.2
0
2019
2020
2021
2022
2023
වර්ෂය
SLSPC
Kalubowitiyana Tea Factory
JEDB



රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ වගාකරනු ලබන අපනයන බෝග අතරින් දෙවන ස්ථානය හිමිවනුයේ මීට වසර 148කට ඉහතදී ඉංග්‍රීසි ජාතිකයන් විසින් මෙරටට හඳුන්වාදුන් ස්වාභාවික රබර් ශාකයටය. දකුණු ඇමෙරිකාවේ ඇමේසන් වනාන්තර නිජබිම වූ රබර් ශාකය 1876 දී මෙරටට හඳුන්වා දෙනු ලැබුවේ ඉංග්‍රීසි ජාතික හෙන්රි විකම් මහතා විසිනි. 1876 දී ආසියාවට සැපත් මේ ප්‍රථම රබර් පැළ තොගයේ කොටසක් ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානයේ සිටුවා ඉතිරිය සිංගප්පූරුවේ ද සිටුවන ලද බව ඉතිහාසයේ සඳහන් වේ. එහෙත් සිංගප්පූරුවේ සිටුවූ පැළවලට සිදුවූ ඉරණම පොත්පත්වල සඳහන් වී නොමැති බැවින් ආසියාවේ සියලු රටවල රබර් කර්මාන්තය ව්‍යාප්ත කර වූයේ එදා ගම්පහ උද්‍යානයේ රෝපණය කල පැළ මගින් ලබාගත් රෝපණ ද්‍රව්‍ය වලින් බව මතය වී තිබේ. ආසියාවේ රබර් ප්‍රචලිත කිරීම හේතුවෙන් හෙන්රි විකම්ට බ්‍රිතාන්‍ය රජු විසින් නයිට් නාමයක් ද පුද කරන ලදී. 1900 මුල් කර්තුවේ ශ්‍රී ලංකාවේ රෝපණය කල බ්‍රසීලයෙන් ගෙන ආ පැළ වලින් ලබාදී ඇති අස්වැන්න වසරකට හෙක්ටයාරයකින් කිලෝ 75ක් පමණ බව වාර්තා වේ.

හෙනරත්ගොඩ රෝපණය කර ඇරඹූ රබර් වගාවෙන් ලබා ගන්නා ලද රබර් කිරි මුදවීමට යොදා ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම උදෙසා වර්ෂ 1909 දී ලොව ප්‍රථම රබර් පර්යේෂණායතනය ඉංග්‍රීසි ජාතිකයන් විසින් ශ්‍රී ලංකාවේ කළුතර දී ආරම්භ කරන ලදී.

මෙලෙස ආරම්භ කරන ලද රබර් වගාවේ ව්‍යාප්තිය 2023 වර්ෂය වන විට හෙක්ටයාර 98,393 වගා භූමි ප්‍රමාණයක් දක්වා විහිද ඇති අතර 2023 වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 64,444ක් පමණ වේ.


2019 සිට 2022 දක්වා කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයට රබර් ක්ෂේත්‍රයේ දායකත්වය පහත දක්වා ඇත.


වර්ෂය	රබර් නිෂ්පාදන දායකත්වයේ ප්‍රතිශතය (%)
2019	0.2
2020	0.3
2021	0.2
2022	0.2

රබර් වගාවේ ප්‍රගතිය - (2017-2022)

ශීර්ෂය	ඒකකය	2017	2018	2019	2020	2021	2022
නිෂ්පාදනය	කි.ග්‍රෑ. මිලියන	83.1	82.6	74.8	78.2	76.9	70.9
මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	137	137	138	138	139	139
කිරි කපන ලද බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	103	107	114	121	113	107
සාමාන්‍ය ඵලදාව	හෙක්ටයාරට කි.ග්‍රෑ.	809	774	658	649	679	665
නිෂ්පාදන පිරිවැය	රු./කි.ග්‍රෑ.	195.00	205.00	210.00	213.50	221.00	288.00
නැවත වගා කිරීම	හෙක්ටයාර	1,338	842	1,040	976	1,522	1,264
අලුතින් වගා කිරීම	හෙක්ටයාර	677	973	1,103	751	1,188	489

(මූලාශ්‍රය - 2022 මහ බැංකු වාර්තාව)





පොල් නිෂ්පාදනය


1948 න් පසුව මෙරට ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික උත්පාදන මාර්ගය බවට වැවිලි භෝග පත්වූ අතර මෙරට ආපනයන ආදායමේ සැලකිය යුතු ප්‍රතිශතයක් පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් ලබා ගත හැකි විය. පොල් වගාව සඳහා මිලි ලීටර 1300-2300 පමණ වාර්ෂික වර්ෂාපතනයක් ද, සෙල්ලියස් අංශක 27 ක පමණ වාර්ෂික උෂ්ණත්වයක්ද, ලවණ මිශ්‍ර පසක් ද අවශ්‍ය වන බව හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම පොල් වගා කිරීමේ හැකියාව පවතින අතර කොළඹ, කුරුණෑගල, හලාවත යන පොල් ත්‍රිකෝණයේ සාර්ථකව පොල් වගාව සිදු කරනු ලබයි. එමෙන්ම නව පොල් ත්‍රිකෝණයක් යාපනය, මන්නාරම හා මුලතිව් හි ඇරඹීමට ද කටයුතු කරමින් පවතී.


2023 වර්ෂයේ දී පොල් වගාවේ නිෂ්පාදන ධාරිතාවය පොල් ගෙඩි මිලියන 2944ත් ලෙස වාර්තා වේ. 2023 වර්ෂයේ දී පොල් හා පොල් හා ආශ්‍රිත නිෂ්පාදනයන්හි අපනයන ආදායම ඇ.ඩො.මි.700.47 ලෙස වාර්තාවේ.

පොල් වගාවේ ප්‍රගතිය - (2017-2022)

ශීර්ෂය	ඒකකය	2017	2018	2019	2020	2021	2022
නිෂ්පාදනය	ගෙඩි මිලියන	2,450	2,623	3,086	2,792	3,120	3,391
මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	452	499	503	505	505	505
නිෂ්පාදන පිරිවැය	ගෙඩියකට රුපියල්	16.69	18.84	18.33	21.81	26.96	27.21
නැවත වගා කිරීම	හෙක්ටයාර	8,824	7,548	5,931	5,333	4,709	5,481
අලුතින් වගා කිරීම	හෙක්ටයාර	15,121	10,183	6,842	8,000	9,622	13,913

(මූලාශ්‍රය - 2022 මහ බැංකු වාර්තාව)


ජාතික පොල් නිෂ්පාදනය (2019-2023)
පොල් නිෂ්පාදනය (මෙයි මිලියන)
4000
3500
3000
2500
2000
1500
1000
500
0
2019
2020
2021
2022
2023
වර්ෂය
ජාතික පොල් නිෂ්පාදනය


අමාත්‍යාංශය හා අනුබද්ධිත රාජ්‍ය ව්‍යවසායන්හි පොල් නිෂ්පාදනයේ විචලනය (2019-2023)
පොල් නිෂ්පාදනය (මෙයි මිලියන)
18
16
14
12
10
8
6
4
2
0
2019
2020
2021
2022
2023
වර්ෂය
Chilaw Plantations
Kurunegala Plantations
Elkaduwa Plantations

සුළු අපනයන වැවිලි භෝග

“Ceylon Spices” ලෙස ඊටම ආවේණික රස, ගුණ, හා වර්ණයන්ගෙන් සමන්විත කුරුඳු, ගම්මිරිස්, කෝපි, කොකෝවා, එනසාල්, කරාබුනැටි ඇතුළු කුඩා වැවිලි භෝගයන්ගෙන් නිෂ්පාදනය වන ශ්‍රී ලාංකේය කුළුබඩු විශ්ව කීර්තියක් දිනා ඇත. එයින් ද “Ceylon True Cinnamon” හෙවත් ශ්‍රී ලාංකේය සත්‍ය කුරුඳු මේ වන විට ජගත් භූගෝලීය දර්ශකය (GI Indicators) දිනා ඇති අතර “Kolonna Pepper” (කොලොන්න ගම්මිරිස්) ලෝක වෙළඳපොල තුල භූගෝලීය දර්ශකයද දිනා ගැනීමට ආසන්නව සුවිශේෂී ස්ථානයත් ලබා ගෙන ඇත. ලොව හොඳම සත්‍ය කුරුඳු නිෂ්පාදකයා වන්නේද ශ්‍රී ලාංකාවයි. ශ්‍රී ලාංකාව තුළ මාතර, ගාල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි කුරුඳු ද, රත්නපුර, මහනුවර, මාතලේ ඇතුලු දිස්ත්‍රික්කයන්හි ගම්මිරිස් ද බහුලව වගා කෙරෙන අතර සමස්ථයක් ලෙස හෙක්ටයාර 122,605ක වපසරියක කුඩා වැවිලි භෝග වගා කෙරෙමින් වාර්ෂිකව ඇ.ඩො.මිලියන 500 ඉක්මවූ අපනයන ආදායමක් අත් කර දෙනු ලබයි.

මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යවසායන් අතුරින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, සී/ස කුරුණෑගල වැවිලි සමාගම, සී/ස හලාවත වැවිලි සමාගම හා සී/ස ඇල්කඩුව වැවිලි සමාගම ඔවුන් සතු ඉඩම්වල යම් ප්‍රමාණයක් මෙම සුළු අපනයන වැවිලි භෝග සඳහා ද වෙන් කර ඇත.

සුළු අපනයන වැවිලි භෝග නිෂ්පාදනය - (2017-2022)

බෝගය	ඒකකය	2017	2018	2019	2020	2021	2022
කෝපි	මෙට්‍රික් ටොන්	2,496	2,294	2,287	2,345	2,439	4,827
කොකෝවා	මෙට්‍රික් ටොන්	471	413	548	612	658	1,221
කුරුඳු පොතු	මෙට්‍රික් ටොන්	22,341	20,398	20,352	20,866	22,872	23,764
ගම්මිරිස්	මෙට්‍රික් ටොන්	29,546	22,551	22,156	23,970	25,047	44,090
කරාබු නැටි	මෙට්‍රික් ටොන්	6,413	3,360	4,786	3,512	3,837	5,722
කරදමුංගු	මෙට්‍රික් ටොන්	113	86	69	86	104	690
සාදික්කා සහ වසාවාසි	මෙට්‍රික් ටොන්	3,545	4,180	5,119	2,751	2,818	3,618
කජු මද	මෙට්‍රික් ටොන්	1,600	1,602	2,400	2,450	1,225	ලැ.නො.

(මූලාශ්‍රය - 2022 මහ බැංකු වාර්තාව)

අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය වැවිලි ව්‍යවසායන්හි ශුද්ධ මූල්‍ය ප්‍රගතිය (ලාභ/අලාභ විචලනය)

